# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2307/14 - 2022 නොවැම්බර් මස 23 වැනි බදාදා - 2022.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කුලියාපිටිය නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

සභාවේ අවසරයක් නොමැතිව නොකඩවා සාමාන්‍ය රැස්වීම් වාර 03ට වැඩි සංඛ්‍යාවක් සඳහා සහභාගී නොවීම හේතු කොට ගෙන කුලියාපිටිය නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කුලියාපිටිය නගර සභාවේ අංක 03 - දණ්ඩගමුව කොට්ඨාසයට තේරී පත් වූ බන්නැහැක මුදියන්සේලාගේ ඉන්දික මහේෂ් බන්නැහැක අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, කුලියාපිටිය නගර සභාවේ අංක 03 - දණ්ඩගමුව කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා විදානලාගේ විල්ප්‍රඩ් සිල්වා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කුලියාපිටිය නගර සභාවේ තේරීම්භාර නිලධාරී රත්නායක මුදියන්සේලාගේ හරේන්ද්‍ර බණ්ඩාර රත්නායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් විදානලාගේ විල්ප්‍රඩ් ද සිල්වා, කුලියාපිටිය නගර සභාවේ අංක 03 - දණ්ඩගමුව කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කරගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

ආර්. එම්. එච්. බී. රත්නායක,
තේරීම්භාර නිලධාරී,
කුලියාපිටිය නගර සභාව.

2022 නොවැම්බර් මස 21 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

EOG 11 - 0249


1A - G 38126 — 16 (2022/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*